නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
FMM SRI LANKA Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

2022 අප්‍රේල්

2 වන වෙළුම - කලාප අංක 4










**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය තෝරාගෙන ඇති විෂය පථයට / සංරචකයන්ට අදාළ සිදුවීම් 26ක් 2022 අප්‍රේල් මාසයේදී නිරීක්ෂණය විය. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතබවට අදාළ සිදුවීම් 9ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 9ක්, මාධ්‍යයේ ස්වාධීනත්වයට අදාළ සිදුවීම් 1ක් සහ ව්‍යුහාත්මක කොන්දේසි යටතට ගැනෙන සිදුවීම් 7ක් ඒ අතර වෙයි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

1. මිරිහානේ උද්ඝෝෂණය අතරතුරදී බස් රථයක් ගිනිගැනීමේ සිද්ධිය පිළිබඳව පසුවිපරමක යෙදී සිටි තරිඳු ජයවර්ධන ඇතුළු මාධ්‍යවේදීන් පිරිසකට ජනාධිපති මාධ්‍ය අංශයේ නිලධාරියකු ලෙස හඳුන්වාගත් අයෙක් තර්ජනය කිරීම.
2. සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වන අනුරුද්ධ බණ්ඩාර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අත්අඩංගුවට ගැනීම.
3. මිරිහානේදී පැවති උද්ඝෝෂණයට සහභාගී වීම හේතුවෙන්, ලේක්හවුස් සමාජ මාධ්‍ය ප්‍රධානී මංජුල සමරසේකරගේ සේවය අත්හිටුවීම.
4. මිරිහානේ උද්ඝෝෂණයට සිරස රූපවාහිනියේ වාර්තාකරණය බලපෑ බවට චෝදනා කරමින්, ඒ පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමට පොලිස්පතිවරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියෝග කිරීම.
5. ජනාධිපතිවරයා විසින් හදිසි නීතිය පනවනු ලැබීම හා දින 5කට පසුව එය ඉවත් කිරීම.
6. ආරක්ෂක අමාත්‍යාංශයේ දැනුම්දීම මත සමාජ මාධ්‍යවලට ප්‍රවේශ වීම වැළැක්වීමට විදුලි සංදේශ නියාමන කොමිසම කටයුතු කිරීම.

7. මිරිහානේදී ජනමාධ්‍යවේදීන්ට හා උද්ඝෝෂකයින්ට පහරදීම ගැන ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයෙන් ජනමාධ්‍ය ඇමතිවරයාට ලිපියක් යොමු කිරීම හා ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමයෙන් පොලිස්පතිවරයාට පැමිණිල්ලක් යොමු කිරීම.

8. හදිසි නීතිය පැනවීම, ඇඳිරිනීතිය පැනවීම හා සමාජ මාධ්‍ය අවහිරයට එරෙහිව, ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ පෙත්සම් 4ක් ගොනු කිරීම.

9. උද්ඝෝෂකයන්ගේ ආරක්ෂාව හා සුබසාධනය පිළිබඳව මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් යොමු කිරීම.

10. මිරිහානේ සිදුවීම් සම්බන්ධයෙන් රක්ෂිත බන්ධනාගාරගත කළ 6 දෙනාට ඇප නියම කිරීම.

11. ශ්‍රී ලංකාවේ ඇති වී තිබෙන අර්බුදකාරී තත්ත්වය සහ භාෂණයේ හා ප්‍රකාශනයේ අයිතිය සම්බන්ධව මානව හිමිකම් සංවිධාන වෙත ලිපියක් යොමු කිරීම.

12. ගෝල්ෆෙස් අරගල භූමිය තුළ මාධ්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම.

13. ගෝල්ෆෙස් අරගල භූමියෙහි ස්ථාපනය කළ 'ඩයලොග්' සන්නිවේදන කුලුන උද්ඝෝෂකයින්ගේ විරෝධය හේතුවෙන් ඉවත් කර ගැනීම.

14. ගාල්ල නගරයේ ආරම්භ කළ 'ගෝඨාගෝගම' අරගල භූමියේ කූඩාරමක් පොලිසියේ මැදිහත් වීමෙන් කඩා ඉවත් කිරීම.

15. ගෝල්ෆෙස්හි පැවැත්වෙන විරෝධතාවට සහාය දක්වමින් ප්‍රකාශයක් කළ පොලිස් නිලධාරියකු අත්අඩංගුවට ගැනීම.

16. රඹුක්කනදී විරෝධතාකරුවන් පිරිසකට පොලිසිය කළ වෙඩි තැබීමකදී එක් පුද්ගලයකු මියගොස් තවත් පිරිසක් තුවාල ලැබීම.

17. 'සාමකාමී ජන අරගලයට නීතිමය රැකවරණය තහවුරු කරන ලෙස' ඉල්ලමින් අධිකරණ සේවා කොමිසමට පෙත්සමක් ඉදිරිපත් කිරීම.

18. ගෝල්ෆේස් ජන අරගලයට ජනමාධ්‍යවේදීන් සාමූහිකව සහාය පළ කිරීම.

19. අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ උද්ඝෝෂණ පෙළපාළියකට එරෙහිව වාරණ නියෝගයක් ලබා දීම අධිකරණය ප්‍රතික්ෂේප කිරීම.

20. ලේඛකයින්, ප්‍රකාශකයින් හා මුද්‍රණකරුවන් ජන අරගලයට සහාය පළ කරමින් පා ගමනක් සංවිධානය කිරීම.

21. ගෝල්ෆෙස් අරගල භූමියෙහි පැවැත්වීමට නියමිතව තිබූ 'ජනතා වේදිකාව' සංගීත ප්‍රසංගය, අරගලයට සම්බන්ධ පිරිසකගේ විරෝධය නිසා අවලංගු කිරීම.

22. ගෝල්ෆෙස් අරගල භූමියේ සවි කර තිබූ, ඝාතනයට, අතුරුදන් කිරීමට හා වධහිංසාවට ලක් වූ ජනමාධ්‍යවේදීන්ගේ රූ ඇතුළත් පුවරු කඩා දැමීම.

23. අරලියගහ මන්දිරය ඉදිරිපිට උද්ඝෝෂණයේ නිරත පිරිස ඉවත් කිරීමට පොලිසිය කළ ඉල්ලීමක් අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම.

24. අරලියගහ මන්දිරය ඉදිරිපිට අරගලකරුවන් පොලිස් ට්‍රක් රථයකට යට කොට අනතුරක් සිදු කිරීමට දැරූ උත්සාහයක් පිළිබඳව පොලිසියට පැමිණිලි කිරීම.

25. වසර 17කට පෙර ඝාතනයට ලක් ව මෙතෙක් යුක්තිය ඉටු නොවූ මාධ්‍යවේදී ධර්මරත්නම් ශිවරාම් අනුස්මරණය කිරීම.

26. අරලියගහ මන්දිරය ඉදිරිපිටදී උද්ඝෝෂකයකු පොලිස් ප්‍රහාරයට ලක්ව රෝහල්ගත කිරීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2022 අප්‍රේල්**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 09 |
| නීතිමය කොන්දේසි | 09 |
| මාධ්‍යයේ ස්වාධීනත්වය | 01 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 07 |
| **එකතුව** | **26** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස බරපතළ ලෙස උල්ලංඝනය වූ අවස්ථා 9ක් අප්‍රේල් මාසයේදී නිරීක්ෂණය විය.**

**ගෝල්ෆේස් අරගලභූමියෙහි සන්නිවේදන කුලුනක් සවි කිරීමේ ආන්දෝලනාත්මක සිදුවීමේ යථා තත්ත්වය කුමක් වුවද මාධ්‍යවේදීන් හා අරගලකරුවන් ඒ සම්බන්ධයෙන් දැක් වූ විරෝධය, 'ආරක්ෂාව හා නිදහස පිළිබඳ මාධ්‍යවේදීන්ගේ ආත්මීය හැඟීම' යන දර්ශකයට අදාළ වන බැවින් මෙම සංරචකය යටතේ සලකා බැලිණි.**

2 වගුව: 2022 අප්‍රේල්: මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 09

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ප්‍රහාර | 02 |
| මානසික බලපෑම් | 06 |
| ආරක්ෂාව හා නිදහස පිළිබඳ මාධ්‍යවේදීන්ගේ ආත්මීය හැඟීම | 01 |
| **එකතුව** | **09** |

1. **මිරිහානේ උද්ඝෝෂණය අතරතුරදී බස් රථයක් ගිනිගැනීමේ සිද්ධිය පිළිබඳව පසුවිපරමක යෙදී සිටි තරිඳු ජයවර්ධන ඇතුළු මාධ්‍යවේදීන් පිරිසකට ජනාධිපති මාධ්‍ය අංශයේ නිලධාරියකු ලෙස හඳුන්වාගත් අයෙක් තර්ජනය කිරීම.**

   අප්‍රේල් 1 වන දින උදෑසන මෙම ස්ථානයට පැමිණි මාධ්‍යවේදීන්ට නුවන් තාරක නැමති පුද්ගලයා බාධා කර ඇති අතර, තමන්ට බැණ තර්ජනය කොට රාජකාරියට බාධා කිරීම සම්බන්ධයෙන් තරිඳු ජයවර්ධන මිරිහාන පොලිසියට පැමිණිලි කර තිබේ. (පැමිණිලි අංකය CIB II 283/300)

   මූලාශ්‍රය: www.facebook.com

2. **මිරිහානේ උද්ඝෝෂණයට සිරස රූපවාහිනියේ වාර්තාකරණය බලපෑ බවට චෝදනා කරමින්, ඒ පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමට පොලිස්පතිවරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියෝග කිරීම.**

   පොලිස්පතිවරයාගේ අංක IGP/PA/CID/OUT/76/22 හා අප්‍රේල් 1 දාතම දරන ලිපියෙන් මෙම නියෝගය සිදු කර තිබේ. 'හිතාමතාම මහජනතාව කුපිත කිරීමේ අරමුණින් සහ මහජන සාමය කඩ වන පරිදි කටයුතු කිරීමට මහජනතාව පෙළඹවීමේ අරමුණින් හෝ රජයට එරෙහිව මහජනතාව කුපිත කිරීම සඳහා මෙම උද්ඝෝෂණය පිළිබඳ සජීවී තොරතුරු විකාශය කිරීම සිදු කර ඇති බව හෝ එසේ විය හැකි බව දැන දැනම එම ප්‍රචාරක කටයුතු සිදු කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.' යනුවෙන් එහි සඳහන් වේ.

   මූලාශ්‍රය: www.facebook.com

3. **ගෝල්ෆේස් අරගලභූමියෙහි ස්ථාපනය කළ 'ඩයලොග්' සන්නිවේදන කුලුන උද්ඝෝෂකයින්ගේ විරෝධය හේතුවෙන් ඉවත් කර ගැනීම.**

   අරගලභූමිය තුළ අන්තර්ජාල ප්‍රවේශය මෙන්ම සාමාන්‍ය ජංගම දුරකථන සබඳතාද මුල සිටම දුර්වල තත්ත්වයක පැවති අතර, වඩාත් හොඳ සේවාවක් ලබා දීම සඳහා මෙම සන්නිවේදන කුලුන ස්ථාපනය කරන බව අදාළ සමාගම ප්‍රකාශ කළේය. විරෝධතාකරුවන්ගේ මතය වූයේ එය අරගලයෙහි නිරත අයගේ තොරතුරු ආරක්ෂක අංශ වෙත ලබා ගැනීමේ උපක්‍රමයක් බවයි. මෙම විරෝධය හේතුවෙන්, අප්‍රේල් 16 වැනිදා එය ඉවත් කර ගැනිණි.

   මූලාශ්‍ර: 1. www.mawratanews.lk 2. gagana.lk

4. **ගාල්ල නගරයේ ආරම්භ කළ 'ගෝඨාගෝගම' අරගලභූමියේ කූඩාරමක් පොලිසියේ මැදිහත්වීමෙන් කඩා ඉවත් කිරීම.**

   අප්‍රේල් 17 වැනිදා ගාල්ල පොලිසියේ නිලධාරීන් පිරිසක් පැමිණ බලහත්කාරයෙන් මෙම කූඩාරම ගලවා ඉවත් කර ඇති අතර පසුව ගාල්ල නීතිඥ සංගමයේ නීතිඥවරුන් පිරිසක් මැදිහත් වී පොලිසිය ලවා එය නැවත ස්ථාපිත කිරීමට පියවර ගෙන තිබේ.

   මූලාශ්‍ර: sinhala.lankanewsweb.net

5. **රඹුක්කනදී පොලිසිය කළ වෙඩි තැබීමකදී එක් පුද්ගලයකු මියගොස් තවත් පිරිසක් තුවාල ලැබීම.**

ඉන්ධන ඉල්ලා අප්‍රේල් 19 වැනිදා රඹුක්කන නගරයේදී පැවති උද්ඝෝෂණයක් අතරතුර සිදු වූ මෙම වෙඩිතැබීමෙන් 42 හැවිරිදි චමින්ද ලක්ෂාන් ජීවිතක්ෂයට පත් විය. මේ සම්බන්ධයෙන් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් රජයට දැඩි විරෝධයක් පළ වූ අතර උද්ඝෝෂණ රැසක් පැවැත්විණි. මෙය මනුෂ්‍ය ඝාතනක් බව නිගමනය කළ අධිකරණය වෙඩි තැබීමට සම්බන්ධ හා ඒ සඳහා අණ දුන් නිලධාරීන් අත්අඩංගුවට ගැනීමට නියෝග කළේය.

මූලාශ්‍ර 1. www.facebook.com 2. www.aithiya.lk

6. **ගෝල්ෆේස් අරගල භූමියෙහි පැවැත්වීමට නියමිතව තිබූ 'ජනතා වේදිකාව් සංගීත ප්‍රසංගය', අරගලයට සම්බන්ධ පිරිසකගේ විරෝධය නිසා අවලංගු කිරීම.**

මෙම ප්‍රසංගය අප්‍රේල් 24 වැනිදා පස්වරුවේ පැවැත්වීමට සංවිධානය කර තිබූ අතර කලාකරුවන් රැසක් හා සංගීත කණ්ඩායම් කිහිපයක් ඊට සහභාගී වීමට නියමිතව තිබිණි. අරගලයට විවිධ පාර්ශ්ව අතර මේ සම්බන්ධයෙන් ඇති වූ මත ගැටුම් හා එක් පිරිසක් සෘජුවම පළ කළ විරෝධය හේතුවෙන් ප්‍රසංගය අවලංගු කෙරිණි. පසුව එම ප්‍රසංගයේ අංග ඇතුළත් වැඩසටහනක් රාජගිරිය ගුවන් පාලම අසලදී පවත්වන ලදි.

මූලාශ්‍රː 1. www.facebook.com 2. www.youtube.com

7. **ගෝල්ෆේස් අරගල භූමියේ සවි කර තිබූ, ඝාතනයට, අතුරුදන් කිරීමට හා වධහිංසාවට ලක් වූ ජනමාධ්‍යවේදීන්ගේ රූ ඇතුළත් පුවරු කඩා දැමීම.**

ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට සවි කර තිබූ මෙම පුවරු අප්‍රේල් 28 වැනිදා රාත්‍රියෙහි ගලවා එම කාර්යාල පරිශ්‍රයට විසි කර දමා තිබුණු අතර මෙය ආරක්ෂක අංශ විසින් කරන ලද බවට ජනමාධ්‍යවේදීහු චෝදනා කරති.

අප්‍රේල් 29 වැනිදා අරගල භූමියේ 'ජාත්‍යන්තර මාධ්‍ය මධ්‍යස්ථානයේ' දී පැවති පුවත්පත් සාකච්ඡාවකදී මාධ්‍ය සංවිධාන නියෝජිතයින් ප්‍රකාශ කළේ අදාළ ක්‍රියාව තරයේ හෙළා දකින අතර එම පුවරු නැවත සවි කරන බවයි.

මූලාශ්‍රයː www.facebook.com

8. **අරලියගහ මන්දිරය ඉදිරිපිට අරගලකරුවන් පොලිස් ට්‍රක් රථයකට යට කොට අනතුරක් සිදු කිරීමට දැරූ උත්සාහයක් පිළිබඳව පොලිසියට පැමිණිලි කිරීම.**

අරගලකරුවන්ට අරලියගහ මන්දිරය ඉදිරිපිට පදික වේදිකාවේ රැඳී සිටීමට නොහැකි වන පරිදි බස් රථ සහ ට්‍රක් රථ නතර කර තැබීමට පොලිසිය කටයුතු කර තිබුණු අතර අප්‍රේල් 26 වැනිදා සිවිල් ඇඳුමින් සැරසුණු පුද්ගලයෙක් ඉන් එක් ට්‍රක් රථයක් පසුපසට ධාවනය කිරීමෙන් මෙම අනතුර සිදු කිරීමට උත්සාහ දරා තිබිණි. අදාළ සිදුවීමට මුහුණ පෑ පිරිසගේ දැඩි බලපෑම මත ඒ පිළිබඳ පැමිණිල්ලක් සටහන් කර ගැනීමට පොලිසිය එකඟ වී තිබේ. (පැමිණිලි අංකය CIB 333/116) පදික වේදිකාව අවහිර වන පරිදි ඉහත රථවාහන නතර කිරීමට එරෙහිව නීතිඥයින් කණ්ඩායමක් මීට පෙර පොලිසියට පැමිණලි කර තිබිණි.

මූලාශ්‍රː 1. www.youtube.com 2. lankasara.com

9. **අරලියගහ මන්දිරය ඉදිරිපිටදී උද්ඝෝෂකයකු පොලිස් ප්‍රහාරයට ලක්ව රෝහල්ගත කිරීම.**

අප්‍රේල් 29 වැනිදා මෙම ප්‍රහාරය එල්ල වූ අතර ප්‍රහාරයට ලක්ව ඇත්තේ රුමේෂ් නැමති තරුණයකු බවත්, රෝහල්ගතව සිටින ඔහුගේ තත්ත්වය බරපතළ නොවන අතර ඉදිරියේදී ඒ පිළිබඳ නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවත් නීතිඥ ප්‍රබෝධ රත්නායක සඳහන් කරයි.

මූලාශ්‍රයː FMM- Media Rights Monitoring Desk

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 9ක් අප්‍රේල් මාසය තුළ නිරීක්ෂණය විය. මේ සියල්ලම පාහේ ජනාධිපතිවරයාට හා රජයට ඉල්ලා අස් වන ලෙස බල කරමින් පැන නැගුණු විරෝධතා ව්‍යාපාරයට සම්බන්ධ සිදුවීම් වේ. මෙහිදී විශේෂ කොට දක්වා නොමැති වුවද උද්ඝෝෂණවලට එරෙහිව පොලිසිය විසින් නියෝග ඉල්ලා සිටි අවස්ථා මෙන්ම හදිසි නීතිය හා සමාජමාධ්‍ය තහනම යනාදී කරුණු සම්බන්ධයෙන්ද අධිකරණයේ ක්‍රියාකාරීත්වය 'අධිකරණයේ අපක්ෂපාතීබව' යන දර්ශකය සෘජුවම නියෝජනය කරන බව කිව හැකිය. මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ සඳහා දණ්ඩමුක්තිය යන්න 'නීතිමය කොන්දේසි' යන සංරචකය යටතට ගැනෙන බැවින් මාධ්‍යවේදී සිවරාම් අනුස්මරණයද මෙහි ඇතුළත් කර ඇත.**

**3 වගුව: 2022 අප්‍රේල් : නීතිමය කොන්දේසි - සිදුවීම් 09**

| **දර්ශකය** | **වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව** |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 08 |
| මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධවලදී දණ්ඩමුක්තිය | 01 |
| **එකතුව** | **09** |

1. **සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වන අනුරුද්ධ බණ්ඩාර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අත්අඩංගුවට ගැනීම.**

මෝදර පොලිසියේ නිලධාරීන් ලෙස හඳුන්වා දුන් පිරිසක් අප්‍රේල් පළමුවැනිදා රාත්‍රියේ ඔහු රැගෙන ගොස් තිබූ අතර, මානව හිමිකම් කොමිසමේ මැදිහත්වීම මත ඔහු පිළිබඳ තොරතුරු හෙළි කර ගත හැකි විය. පසුව ඔහු අප්‍රේල් 2 වැනිදා රාත්‍රියේ අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව ඇප මත මුදාහැරිණි. ඔහු වෙනුවෙන් නීතිඥවරුන් සියයකට අධික පිරිසක් පෙනී සිටීම විශේෂත්වයකි. අනුරුද්ධ බණ්ඩාර GoHomeGota2022 ෆේස්බුක් සමූහයේ ඇඩ්මින්වරයකු වන අතර ඔහු අත්අඩංගුවට ගෙන ඇත්තේ දණ්ඩ නීති සංග්‍රහයේ 120 වගන්තිය යටතේය.

මෙසේ අත්අඩංගුවට ගෙන සිය මූලික අයිතිවාසිකම් කඩ කිරීම සම්බන්ධයෙන් රුපියල් මිලියන 100ක වන්දියක් ඉල්ලා අනුරුද්ධ බණ්ඩාර අප්‍රේල් 29 වැනිදා ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළේය.

මූලාශ්‍ර: 1. https://www.dailymirror.lk
2. https://fb.watch
3. https://www.newsfirst.lk

2. **ජනාධිපතිවරයා විසින් හදිසි නීතිය පනවනු ලැබීම හා දින 5කට පසුව එය ඉවත් කිරීම.**

මහජන ආරක්ෂක ආඥා පනතේ දෙවන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව අප්‍රේල් 01 වැනිදා සිට හදිසි නීතිය ක්‍රියාත්මක කරන බව එම අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් විය. ශ්‍රී ලංකා නීතිඥ සංගමය මෙම තීරණයට දැඩිව විරෝධය පළ කළ අතර, ජාතික ආරක්ෂාවට තර්ජනයක් ඇති බවට ප්‍රමාණවත් කරුණු දැක්වීමකින් තොරව හදිසි නීතිය පැනවීම ජනතාවගේ මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් බව මානව හිමිකම් කොමිසන් සභාව නිගමනය කළේය. 5 වැනිදා මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක වන පරිදි හදිසි නීතිය ඉවත් කෙරිණි.

මූලාශ්‍රය: https://www.bbc.com

3. **ආරක්ෂක අමාත්‍යාංශයේ දැනුම්දීම මත සමාජ මාධ්‍යවලට ප්‍රවේශ වීම වැළැක්වීමට විදුලි සංදේශ නියාමන කොමිසම කටයුතු කිරීම.**

අප්‍රේල් 2 වැනිදා මධ්‍යම රාත්‍රියේ සිට මෙම තහනම ක්‍රියාත්මක වූ අතර එම පියවර එක්සත් ජාතීන්ගේ සංවිධානය, ඇමරිකා එක්සත් ජනපදය ඇතුළු ජාත්‍යන්තර ප්‍රජාවගේ දැඩි විවේචනයට ලක් විය. මේ සම්බන්ධයෙන් සමාජමාධ්‍ය පදනම් කරගෙන මාධ්‍යකරණයේ නිරත මාධ්‍ය ආයතන හා ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කර තිබිණි. ආරක්ෂක අමාත්‍යාංශයේ දැනුම්දීමකින් පමණක් වහා සමාජ මාධ්‍ය අත්හිටුවීමට විදුලි සංදේශ නියාමන කොමිසමට කිසිදු අයිතියක් නොමැති බවත් එම පියවර මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් බවත් අප්‍රේල් 3 වැනිදා රැස් වූ මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රකාශ කළේය. එදින සවස 3.30 සිට එම තහනම ඉවත් කෙරිණි.

මූලාශ්‍ර: 1. https://www.bbc.com
2. https://www.newsfirst.lk

4. **හදිසි නීතිය පැනවීම, ඇඳිරිනීතිය පැනවීම හා සමාජ මාධ්‍ය අවහිරයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ පෙත්සම් 4ක් ගොනු කිරීම.**

ඉහත ක්‍රියාමාර්ගවලට එරෙහිව ගොනු කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම් හතරක් විභාගයට ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය අප්‍රේල් 7 වැනිදා තීරණය කළේය.

මාධ්‍යවේදීන් වන රසික ජයකොඩි, රොයෙල් රේමන්ඩ්, මානව හිමිකම් ක්‍රියාකාරිනියක වන ශ්‍රීන් ෂෂී වින්සන්ට්, මොරටුව නාගරික මන්ත්‍රීවරියක වන ලිහිනි ප්‍රනාන්දු විසින් මේ පෙත්සම් ගොනු කර තිබිණි.

මූලාශ්‍රය: http://www.dinamina.lk

5. **මිරිහානේ සිදුවීම් සම්බන්ධයෙන් රක්ෂිත බන්ධනාගාරගත කළ 6 දෙනාට ඇප නියම කිරීම.**

මාර්තු 31 වැනිදා මිරිහාන විරෝධතාවයේදී අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කර සිටි සැකකරුවන් 6 දෙනා, අප්‍රේල් 6 වැනිදා පැවති හඳුනාගැනීමේ පෙරට්ටුවේදී හඳුනා ගැනීමට නොහැකි වූ අතර ඔවුන්

ඇප මත මුදා හැරිණි.

සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකරුවන් 27 දෙනෙකු අප්‍රේල් පළමුවැනිදා ගංගොඩවිල මහේස්ත්‍රාත්වරයා හමුවට ඉදිරිපත් කෙරුණු අතර, ඉහත 6 දෙනා හැර සෙසු 21දෙනා ශරීර ඇප මත මුදාහැරිණි.

මූලාශ්‍රය: https://www.newscutter.lk

6. **ගෝල්ෆේස්හි පැවැත්වෙන විරෝධතාවට සහාය දක්වමින් ප්‍රකාශයක් කළ පොලිස් නිලධාරියකු අත්අඩංගුවට ගැනීම.**

පොලිස් නිල ඇඳුමින් සැරසී ගෝල්ෆෙස් අරගල භූමියේදී ජන අරගලයට සහාය පළ කරමින් ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළ ඩබ්.එම්. අමරදාස නම් පොලිස් සැරයන්වරයකු අප්‍රේල් 14 වැනිදා පොලිසිය මගින් අත්අඩංගුවට ගැනිණි. 15 වැනිදා කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කෙරුණු ඔහු ඇප මත මුදාහැරිණි. ජනාධිපති නීතිඥ රියෙන්සි අර්සකුලරත්න ඇතුළු ජ්‍යේෂ්ඨ නීතිඥවරු රැසක් ඔහු වෙනුවෙන් පෙනී සිටයහ.

මූලාශ්‍ර:
1. https://www.facebook.com
2. http://www.aruna.lk

7. **අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ උද්ඝෝෂණ පෙළපාළියකට එරෙහිව වාරණ නියෝගයක් ලබා දීම අධිකරණය ප්‍රතික්ෂේප කිරීම.**

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 106 (01) වගන්තිය ප්‍රකාරව ශිෂ්‍ය නායකයින් 16 දෙනෙකු වගඋත්තරකරුවන් ලෙස නම් කරමින් කොළඹ කොටුව පොලීසිය අධිකරණයෙන් මෙම ඉල්ලීම කර තිබුණි. ඉදිරියේදී පැවැත්වීමට නියමිත උද්ඝෝෂණයක් වැළැක්වීම සඳහා තමන්ට නියෝග නිකුත් කළ නොහැකි යැයි සඳහන් කළ කොළඹ අතිරේක මහේස්ත්‍රාත්වරයා, උද්ඝෝෂණකරුවන් නීති විරෝධී කටයුත්තක නිරත වුවහොත් පොලිස් බලතල පාවිච්චි කරන ලෙසට පොලිසියට දැනුම් දුන්නේය.

මූලාශ්‍රය: https://www.mawratanews.lk

8. **අරලියගහ මන්දිරය ඉදිරිපිට උද්ඝෝෂණයේ නිරත පිරිස ඉවත් කිරීමට පොලිසිය කළ ඉල්ලීමක් අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම.**

කොල්ලුපිටිය අරලියගහ මන්දිරය ඉදිරිපිට මහජන පීඩාවක් වන ආකාරයෙන් පිරිසක් විරෝධතාවයේ යෙදෙමින් සිටින බැවින් එය නවතා දමන ලෙසට එම උද්ඝෝෂණකරුවන්ට නියෝගයක් නිකුත් කරන්නැයි කොල්ලුපිටිය පොලීසිය කළ ඉල්ලීමක් කොළඹ අතිරේක මහේස්ත්‍රාත් හර්ෂණ කැකුණවෙල මහතා 25 වැනිදා ප්‍රතික්ෂේප කළේය.

මූලාශ්‍රය: https://www.truenews.lk

9. **වසර 17කට පෙර ඝාතනයට ලක් ව මෙතෙක් යුක්තිය ඉටු නොවූ මාධ්‍යවේදී ධර්මරත්නම් ශිවරාම් අනුස්මරණය කිරීම.**

2005 අප්‍රේල් 29 වැනිදා ඝාතනයට ලක් වූ ශිවරාම් අනුස්මරණය කරමින්, ඔහුට යුක්තිය ඉටු නොකිරීමට විරෝධය පළ කෙරෙන අවස්ථා 3ක් අප්‍රේල් 29 වැනිදා මුලතිව්හිදී, මඩකලපුවේදී හා කොළඹ ගෝල්ෆෙස් අරගල භූමියේදී පැවැත්විණි.

මූලාශ්‍ර:
1. https://twitter.com
2. https://twitter.com
3. https://twitter.com

## මාධ්‍යයේ ස්වාධීනත්වය

**මාධ්‍යයේ ස්වාධීනත්වය යන සංරචකයට, මාධ්‍ය ආයතනයක් තුළ මාධ්‍යවේදීන්ගේ ස්වාධීනත්වය, විදෙස් මාධ්‍යවල කර්තෘමණ්ඩල ස්වාධීනත්වය, දේශපාලනඥයින්ගේ පීඩනයෙන්, ව්‍යාපාරික බලවතුන්ගේ බලපෑමෙන් හා ආගමික බලපෑම්වලින් මාධ්‍යයේ ස්වාධීනත්වය, වෙළෙඳ දැන්වීම් ලබා දීමෙන් හෝ නොදීමෙන් අන්තර්ගතයට බලපෑම් කිරීම යන දර්ශක අයත් වේ. එයින් මාධ්‍ය ආයතනයක් තුළ මාධ්‍යවේදීන්ගේ ස්වාධීනත්වය යන දර්ශකය යටතට ගැනෙන එක් සිදුවීමක් අප්‍රේල් මාසයේදී නිරීක්ෂණය විය.**

**4 වගුව: 2022 අප්‍රේල්: මාධ්‍යයේ ස්වාධීනත්වය - සිදුවීම් 01**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| මාධ්‍ය ආයතනයක් තුළ මාධ්‍යවේදීන්ගේ ස්වාධීනත්වය | 01 |
| **එකතුව** | **01** |

1. **මිරිහානේදී පැවති උද්ඝෝෂණයට සහභාගී වීම හේතුවෙන්, ලේක්හවුස් සමාජ මාධ්‍ය ප්‍රධානී මංජුල සමරසේකරගේ සේවය අත්හිටුවීම.**

මාර්තු 31 වැනිදා එම උද්ඝෝෂණයට ඔහු සහභාගී වී සිටින දර්ශන මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වූ අතර ඒ හේතුවෙන් ඔහුගේ සේවය අත්හිටුවන බව අප්‍රේල් පළමුවැනිදා පාලනාධිකාරිය විසින් දැනුම් දී තිබේ. ආයතනයේ රාජකාරි නිම වීමෙන් පසුව ආපසු යමින් සිටියදී උද්ඝෝෂණයට සහභාගී වූ බවත් එය තම මූලික අයිතිවාසිකමක් බවත් මංජුල සමරසේකර ප්‍රකාශ කරයි.

මූලාශ්‍ර: 1. FMM Media Rights Monitoring Desk
2. https://www.youtube.com

---

## ව්‍යුහාත්මක කොන්දේසි

**'ව්‍යුහාත්මක කොන්දේසි' යන්න මාධ්‍ය නිදහස පිළිබඳව සලකා බැලෙන වැදගත් සංරචකයකි. මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම මානයට ඇතුළත්ය. ඒ අතරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' සහ දර්ශකයට අයත් වන අවස්ථා 6ක් සහ 'ස්වාධීන හා කාර්යක්ෂම මාධ්‍ය නිෂ්පාදනය හා බෙදාහැරීමේ පහසුකම්' යන දර්ශකයට අදාළ වන එක් අවස්ථාවක් අප්‍රේල් මාසයේදී නිරීක්ෂණය විය.**

**5 වගුව: 2022 අප්‍රේල්: ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 07**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 06 |
| ස්වාධීන හා කාර්යක්ෂම මාධ්‍ය නිෂ්පාදනය හා බෙදාහැරීමේ පහසුකම | 01 |
| **එකතුව** | **07** |

1. **මිරිහානේදී ජනමාධ්‍යවේදීන්ට හා උද්ඝෝෂකයින්ට පහරදීම ගැන ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයෙන් ජනමාධ්‍ය ඇමතිවරයාට ලිපියක් යොමු කිරීම හා ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමයෙන් පොලිස්පතිවරයාට පැමිණිල්ලක් යොමු කිරීම.**

මෙම ලිපි දෙකෙන්ම භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස උල්ලංඝනය කිරීම හා පහරදීම් හෙළා දකින අතර ඒ පිළිබඳව වහා පියවර ගත යුතු බව අවධාරණය කර තිබේ. පොලිස්පතිවරයා ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වමින්, මිරිහාන පොලිස් ස්ථානය තුළදී පුද්ගලයන්ට පහරදීම සහ එය වළක්වා නොගැනීම සම්බන්ධයෙන් එදින රාත්‍රී මිරිහාන පොලිස් ස්ථානයේ සිටි සහ එය අධීක්ෂණය කළ නිලධාරීන්ට එරෙහිව විමර්ශනයක් සිදු කරන ලෙස නුගේගොඩ කොට්ඨාස භාර පොලිස් අධිකාරීවරයාට දැනුම් දී තිබේ.

මූලාශ්‍රය: https://satahan.blog

2. **උද්ඝෝෂකයන්ගේ ආරක්ෂාව හා සුබසාධනය පිළිබඳව මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් යොමු කිරීම.**

ජනාධිපතිවරයාට ඉල්ලා අස්වන ලෙස බල කරමින් ගාලුමුවදොර පිටියේ උද්ඝෝෂණවල නිරත පුරවැසියන්ගේ ආරක්ෂාව තහවුරු කරන ලෙසත්, ඔවුන්ගේ සුබසාධන කටයුතු ගැන රජයට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරන ලෙසත් ඉල්ලමින් ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය මෙම පැමිණිල්ල යොමු කර තිබේ. ගණේමුල්ල හමුදා කඳවුරේදී උද්ඝෝෂණය කඩාකප්පල් කිරීම සඳහා පිරිසක් පුහුණු කරන බවට සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වූ වීඩියෝවක් සම්බන්ධයෙන්ද එම පැමිණිල්ලේ සඳහන් වූ අතර, කොමිසම අප්‍රේල් 16 වැනිදා එම කඳවුරට ගොස් අදාළ කරුණ පිළිබඳව විමර්ශනයක නිරත විය. අදාළ චෝදනාව යුද හමුදාව ප්‍රතික්ෂේප කළේය.

මූලාශ්‍ර: 1. https://satahan.blog
2. https://sinhala.srilankabrief.org

3. **ශ්‍රී ලංකාවේ ඇති වී තිබෙන අර්බුදකාරී තත්ත්වය සහ භාෂණයේ හා ප්‍රකාශනයේ අයිතිය සම්බන්ධව මානව හිමිකම් සංවිධාන වෙත ලිපියක් යොමු කිරීම.**

ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා මැදිහත් වන ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය, යුරෝපා සංගමය, ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය, ඉන්දීය මහකොමසාරිස් කාර්යාලය සහ මානව හිමිකම් සංවිධාන වෙත අප්‍රේල් 17වැනිදා මෙම ලිපිය යොමු කර ඇත්තේ ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමයයි.

මිරිහානේ උද්ඝෝෂණයෙන් පසු දෙසතියක පමණ කාලයක් තිස්සේ වර්ධනය වූ මහජන විරෝධතාවලට

එරෙහිව ආණ්ඩුව අනුගමනය කළ මර්දනකාරී පිළිවෙත සම්බන්ධයෙන් මෙම ලිපියෙන් කරුණු දක්වා තිබේ.

මූලාශ්‍රය: https://satahan.blog

4. **ගෝල්ෆේස් අරගල භූමිය තුළ මාධ්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම.**

ගෝල්ෆේස්හි 'ගෝඨාගෝගම' අරගල භූමිය තුළ 'ජාත්‍යන්තර මාධ්‍ය මධ්‍යස්ථානයක්' ස්ථාපිත කිරීම අප්‍රේල් 16 වැනිදා අරගලයට සක්‍රිය ලෙස දායක වන ජනමාධ්‍යවේදීන් පිරිසකගේ මූලිකත්වයෙන් සිදු කෙරිණි. අරගලභූමිය තුළ මාධ්‍යවේදීන්ගේ කටයුතු සඳහා පහසුකම් සැලසීම මෙහි අරමුණයි.

මූලාශ්‍රය: https://www.facebook.com

5. **'සාමකාමී ජන අරගලයට නීතිමය රැකවරණය තහවුරු කරන ලෙස' ඉල්ලමින් අධිකරණ සේවා කොමිසමට පෙත්සමක් ඉදිරිපත් කිරීම.**

නීතිඥවරුන් පිරිසක් විසින් සකස් කෙරුණු මෙම පෙත්සම අප්‍රේල් 19 වැනිදා නීතිඥවරුන් විශාල පිරිසකගේ අත්සනින් යුතුව අධිකරණ සේවා කොමිසම වෙත බාර දෙන ලදි.

මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

6. **ගෝල්ෆේස් ජන අරගලයට ජනමාධ්‍යවේදීන් සාමූහිකව සහාය පළ කිරීම.**

'ජන අරගලයට මාධ්‍යවේදීන්ගේ සහාය' යන්න තේමා කරගත් විරෝධතා පෙළපාලියක් අප්‍රේල් 20 වැනිදා කොටුව දුම්රිය ස්ථානයේ සිට ගෝල්ෆේස් අරගලභූමිය දක්වා පැමිණි අතර අරගල භූමියේ ස්ථාපිත ජාත්‍යන්තර මාධ්‍ය මධ්‍යස්ථානයේදී පුවත්පත් සාකච්ඡාවක් පැවැත්විණි. මාධ්‍යයට එරෙහි අපරාධවලට යුක්තිය ඉටු කිරීමේ අවශ්‍යතාවද මෙහිදී සාකච්ඡාවට ලක් විය.

මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

7. **ලේඛකයින්, ප්‍රකාශකයින් හා මුද්‍රණකරුවන් ජන අරගලයට සහාය පළ කරමින් පා ගමනක් සංවිධානය කිරීම.**

අප්‍රේල් 24 වැනිදා සවස කොල්ලුපිටිය මංසන්ධියේ සිට ගාලු පාර ඔස්සේ ගෝල්ෆේස් අරගලභූමිය කරා ගමන් කළ මෙම පෙළපාලියට ඉහත ක්ෂේත්‍ර නියෝජනය කරන විශාල පිරිසක් එක් වූහ. කඩදාසි හිඟය හා සියලු යෙදවුම්වල මිල ඉහළ යෑම හේතුවෙන් ප්‍රකාශන නිදහසට එල්ල වී ඇති අභියෝගය මෙහිදී විශේෂයෙන් අවධාරණය කෙරිණි.

මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

**6 වගුව: මාධ්‍ය නිදහස: 2022 ජනවාරි - අප්‍රේල් දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| ආවරණය කර ඇති සංරචකය | 2022 ජනවාරි - මාර්තු | | 2022 අප්‍රේල් |
|---|---|---|---|
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 07 | | 09 |
| නීතිමය කොන්දේසි | 04 | 05 | 09 |
| මාධ්‍යයේ ස්වාධීනත්වය | 02 | | 01 |
| වෘත්තීයවේදීත්වය | 02 | | - |
| ව්‍යුහාත්මක කොන්දේසි | 06 | 01 | 07 |
| **එකතුව** | **21** | | **26** |

2022 මාධ්‍ය නිදහස මාසික වාර්තාව ජනවාරි-මාර්තු මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවි සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදි නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


Free Media Movement

Convener: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995
Treasurer: Ananda Jayasekara +94 77 312 4850
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com|Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka|#FMM25